# 1.28 සංස්කෘතය ලේඛනයට පමණක් නොව භාෂණයට ද උචිතය

පූජ්‍ය ගොරඩියකුඹුරේ පඤ්ඤාසාර හිමි
සංස්කෘත අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය. කැලණිය.

## ABSTRACT

මානවයා ඒකචාරී සත්වයෙක් නොවේ. එහෙයින් අන්වයානුගතව සමාජගත වීම් උදෙසා ඔව්හු කිසියම් භාෂාවක් භාවිත කරති. එය මේ මේ භාෂාව විය යුතු යැයි නිශ්චිත නොවන්නේ භාවිත කෙරෙන කවර භාෂාවකින් වුව ද අදහස් හුවමාරු වන බැවිනි. භාෂක සමාජය සලකා යෝග්‍ය භාෂා මාධ්‍යයක් තෝරා ගනිමින් සන්නිවේදන ක්‍රියාවලියෙහි යෙදීම ම හුදෙක් වැදගත් වෙයි. මානවයා ස්වීය අදහස් බාහිර ලෝකයා වෙත මුදාහැරීම සඳහාත් නැවත බාහිර ලෝකයාගේ අදහස් තමා වෙත ලබාගැනීම සඳහාත් ආදියේ පටන් විවිධ භාෂා භාවිතයට ගත්හ. මේ නිසා විවිධ භාෂක සමාජ බිහිවිණි. සමස්ත වර්ගයා ම එක් භාෂාවක් භාවිත කරත් නම් එම සාධකය ම ප්‍රබල වන්නේ සමස්තයා අතරම සන්නිවේදනය මැනවින් සිදුවන බැවිනි. එනමුත් එසේ නොවේ. විවිධ භාෂා භාවිත කරන හෙයින් විවිධ භාෂක සමාජ බිහිවෙයි.

සංස්කෘතය ද ප්‍රබල භාෂාවකි. භාවිත විවිධ භාෂා අතර සංස්කෘතය ව්‍යවහාර භාෂාවක් ය යන සම්මතයට වඩා ලෝකයා හඳුනා ගත්තේ ශාස්ත්‍රීය භාෂාවක් ලෙසිනි. ආදියේ දෙවියන් අතර පමණක් භාවිත වෛදික භාෂාව කාලාතික්‍රමණයත් සමග පොදු ජනයාගේ පරිහරණයට උචිත භාෂාවක් ලෙස සැකසිණි. එය සංස්කෘතයයි. ලේඛන සම්ප්‍රදායය මාධ්‍යයක් ලෙසින් ගෙන ශාස්ත්‍රීය මට්ටමේ ග්‍රන්ථකරණය වටා විදග්ධයෝ ව්‍යාවෘත වූහ. භාෂක සමාජ ගොඩනගා ගත්හ. ආසියාතික ඇතැම් රටවල ප්‍රාන්ත වාසියෝ වත්මන ද සංස්කෘතය වටා විවිධ භාෂක සමාජ ගොඩනගා ගෙන වහරති.

භාෂා ව්‍යවහාරය දෙස විමර්ෂණාත්මකව අවධානය යොමු කළ විට පෙනීයන්නේ කවර භාෂාවක වුව ද දෙයාකර භාවිතයක් පවත්නා බවකි. භාෂාවක් කථනයට එක් ව්‍යවහාරයක් ද භාෂාවක් ලේඛනයට තවත් ව්‍යවහාරයක් ද විද්‍යමාන වෙයි. ශබ්ද / අක්ෂර වශයෙන් හෝ පද / වචන වශයෙන් හෝ ව්‍යාකරණ වශයෙන් හෝ මේ ද්වීරූපී ස්වභාවය සිංහලයෙහි මැනවින් ප්‍රකට වෙයි. නමුත් සංස්කෘතයෙහි මෙබඳු ප්‍රබලතාවයකින් නොවූව ද ඡායාමාත්‍රයෙන් ඔබ්බට ගිය ද්වයාකාර ස්වභාවයක් විද්‍යමාන වෙයි. ලේඛනයෙහි දී භාවිතයට ගන්නා ක්‍රමෝපායයන්ට අනුව සංස්කෘතයෙහි ලේඛන භාෂණ යන ව්‍යවහාරද්වයක් ඇතැයි අනුමාන කළ හැකිය.

භාෂාවක මුඛ්‍යාර්ථය අදහස් ප්‍රකාශනයයි. මුඛ්‍යාර්ථ සාධනයට අවශ්‍ය ප්‍රබල ධර්මතා සංස්කෘතයෙහි නැත්තේ නොවේ. ශාස්ත්‍රීය කාර්යයන්හි භාෂා මාධ්‍යයක් ලෙස විද්වද් පර්ෂදයන් අතර ප්‍රබල වශයෙන් සංස්කෘතය භාවිත වූ බව වෙසෙසා කිව යුතු නොවේ. සාහිත්‍යකරණයේ දී සංස්කෘතය ප්‍රස්ථාවෝචිතව ශිෂිල බවට පත් කරගත් හෙයින් තදනුබද්ධ කෘතිවල ලේඛන ක්‍රමයට සමගාමී භාෂණ ක්‍රම ද ප්‍රවිෂ්ට කර ගැණිනි. ගද්‍ය භාෂා මාධ්‍යය තුළ සංවාද කථන විෂයෙහි ලා ප්‍රබල ලෙස මේ තත්වය දැකිය හැකි ය. සංවාද කථනයන්හි සජීවී බව උදෙසා ලේඛනයෙන් ඔබ්බට ගිය වහා අවබෝධ වන සුළු භාෂණ ක්‍රමයක් භාවිතයට ගැණිනි.

සංස්කෘත සාහිත්‍ය ව්‍යාපාරය තුළ දී විදග්ධ සන්ධානයන්හි භාෂා මාධ්‍යය සංස්කෘතය ම විය. දෘශ්‍යකාව්‍ය හා උපදේශ කාව්‍යයන්හි දී භාවිත සංස්කෘතයෙහි ලේඛන - ලිඛිත සම්ප්‍රදායට වඩා ප්‍රබලව භාෂණ - කථන සම්ප්‍රදාය මතුව පෙනේ. භාෂාවක පැවතිය හැකි ද්විරූපතාව සංස්කෘතය තුළ විද්‍යාමාන වෙතැයි යන ව්‍යවහාරය ගොඩනැගිය හැක්කේ මේ නිසා ය.

භාෂාවක් ලේඛනයට පමණක් භාවිත කරයි නම් එම භාෂාවෙහි පැවැත්ම ලේඛනයට පමණක් ම සීමා වෙයි. එය භාෂාවක පැවතිය යුතු ජීව ගුණයට හානියකි. ජන ව්‍යවහාරයෙන් ගිලිහෙන්නට ද බලපාන සාධකයකි. එහෙත් සංස්කෘතය එසේ ජන ව්‍යවහාරයෙන් ඉවත් කළ යුත්තක් නොව තව තවත් භාවිත කළ යුත්තකි.

හිතෝපදේශ, පංචතන්ත්‍ර ආදී උපදේශ කථා සංග්‍රහයන් හා අභිඥානශාකුන්තල, මෘච්ඡකටික, රත්නාවලී ආදී දෘශ්‍යකාව්‍ය සංග්‍රහයන් මෙහි දී සංස්කෘතය ලේඛන භාෂාවක් පමණක් නොව භාෂණ භාෂාවක් ද වන්නේය යන ප්‍රපඤ්චය ගොඩනගන්නට ප්‍රබල සාධක වෙයි. ඒවායෙහි විද්‍යමාන සංවාද ඛණ්ඩ භාෂණ සංස්කෘත අධ්‍යයනයට අවශ්‍ය නිදර්ශන වෙයි. මේ ඔස්සේ සංස්කෘතය ලේඛනගත භාෂාවක් පමණක් නොව ව්‍යවහාරය සඳහා ද උචිත වූවක් දැයි අධ්‍යයනය කිරීම අපේක්ෂිත අභිමතාර්ථයයි.